මණ්ඩල චක්‍රලේඛ ලිපි : පා21/ 2022

මගේ අංකය: M&E/2022 /1
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
2022.08. 17

සියළුම අතිරේක සාමාන්‍යාධිකාරීවරුන්,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්,
සහකාර සාමාන්‍යාධිකාරීවරුන්,
කළමනාකරුවන්/ ප්‍රධාන ඉංජිනේරුවන්/ ප්‍රධාන ගණකාධිකාරීවරුන්,
මණ්ඩලයේ ලේකම්,
ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,
රසඥ/ සමාජ විද්‍යාඥවරුන්/ භූ විද්‍යාඥවරුන්,
අනෙකුත් අංශ ප්‍රධානීන් ඇතුළු
වැඩභාර නිලධාරීන් වෙත.

**<u>මණ්ඩලීය යාන්ත්‍රික හා විදුලි සම්බන්ධ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම</u>**

ජල සම්පාදන මණ්ඩලය තුළ යාන්ත්‍රික හා විදුලි ක්ෂේත්‍රයට අදාල ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම පහසුකරලීම පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. ඒ අනුව යාන්ත්‍රික හා විදුලි ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු විධිමත් කිරීමේ අරමුණින්,

   i. යාන්ත්‍රික හා විදුලි ක්ෂේත්‍රයට අදාල දෙපාර්තමේන්තු හෝ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු මඟින් සිදුකරන ප්‍රසම්පාදන කටයුතු වලදී මණ්ඩලය මඟින් අනුමත සම්මත ලංසු පත්‍රිකා (Standard Bidding Document) හෝ පිරිවිතර (Specification) වලින් සැලකිය යුතු ලෙස වෙනස් වන (Significantly Deviate) අවස්ථාවලදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික හා විදුලි) ගේ නිර්දේශ ලබාගැනීමෙන් පසු පමණක් සිදුකල යුතුය.

   ii. එමෙන්ම මණ්ඩලය මඟින් සම්මත ලංසු පත්‍රිකා (SBD) හෝ පිරිවිතර (Specification) අනුමත කර නොමැති යාන්ත්‍රික හා විදුලි ක්ෂේත්‍රයට අදාල ප්‍රසම්පාදන කටයුතු වලදී ද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික හා විදුලි) ගේ නිර්දේශය ලබා ගැනීමෙන් පසු පමණක් සිදුකල යුතුය.

තිලිණ එස්. විජේතුංග
සාමාන්‍යාධිකාරී

පිටපත්: 1. සභාපති
2. උප සභාපති
3. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්